**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ එහි පරිපාලිතයන් - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (“සමාගම”) සහ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්හි (“සමූහය”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම් වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජංගම ගිණුම් දෙකක් තුළ එකතුව රු.1,442,996 ක් වූ සෘජු තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | ජංගම ගිණුම් දෙකක් තුළ එකතුව රු.1,442,996 ක් වූ සෘජු තැන්පතු, 2022 මූල්‍ය වර්ෂයේ දී ආර්සීඑල් ගිණුමට මාරු කරනු ලැබේ. (නිත්‍ය පාරිබෝගික ලෙජරය) | මූල්‍ය ප්‍රකාශන තුල සෘජු තැන්පතු හඳුනා ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු ජල බිල්පත රු.2,926,801 ක් විය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් කලින් කලට නිකුත් කරනු ලබන විශේෂ පැහැර හැරීම් ඉන්වොයිසි මත පදනම්ව ජල බිල්පතේ පැහැර හැරීම් මුදල ගෙවනු ලැබේ. | වියදම් හඳුනා ගැනීමේ දී උපචිත පදනම සලකා බැලිය යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ගමන් වියදම් හා අනෙකුත් කාර්ය මණ්ඩල වියදම් පිළිවෙලින් රු.901,200 ක් සහ රු.2,511,260 ක් වන අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම් හඳුනාගෙන නොතිබුණි. | සමාගම සත්‍ය වශයෙන් මාස 12 ක කාල සීමාවකට අදාල නියෝජිතායතන අධීක්ෂණ ගමන් වියදම් ගිණුම් තුල හඳුනා ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂයේ දී මෙම ගැලපීම සිදු කරනු ලැබේ.<br><br>කොවිඩ් සීමාවන් හේතුවෙන් නොගැලපෙන ශ්‍රම වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා වෙනත් කාර්ය මණ්ඩල වියදම් ප්‍රමාණය කිරීම අපහසු විය. | වියදම් හඳුනා ගැනීමේ දී උපචිත පදනම සලකා බැලිය යුතුය. |
| (ඈ)සේවකයින් 28 දෙනෙකුගේ සේවා කාලය අඩුවෙන් ඇස්තමේන්තු කිරීම හේතුවෙන්, විශ්‍රාම ප්‍රතිලාභ | සටහන් කර ගන්නා ලදී. පද්ධතිය තුලින් බාගත කරගන්නා ලද පාරිතෝෂික වාර්තාවේ මාස ප්‍රමාණය ගණනය කිරීමේ දෝෂයක් පවතී. මෙය පද්ධති සැපයුම්කරුට දැනුම් දුන් අතර 2022 දී | සත්‍ය සාධක නිවැරදි ව ඇස්තමේන්තු කළ යුතුය. |

වගකීම් සඳහා වෙන් කිරීම මෙම අවතක්සේරුව/ අධිතක්සේරුව ගලපනු රු.1,627,369 ක් අඩුවෙන් සිදු ලැබේ.
කර තිබුණි.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ විවිධ භාණ්ඩවල, භෞතික ශේෂය හා ලෙජර් ශේෂය අතර රු.2,199,201 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම ගැටළුව විසඳා ගැනීමට නව තොග පද්ධතියක් ක්‍රියාත්මක කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර, හඳුනා නොගත් වෙනස්කම්, සැසඳීම හා ගැලපීම කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.894,426,831 ක් වූ අතර ණයගැති වටිනාකම රු.648,483,238 ක් වන ණයගැතියන් 712 දෙනෙකුට ණයගැති තහවුරු කිරීමේ ලිපි යවා තිබුණි. කෙසේ වෙතත්, 2021 මැයි 04 දින වන විට ණයගැති වටිනාකම රු.46,760,629 ක් වන ණයගැතියන් 47 දෙනෙකුගෙන් පමණක් ප්‍රතිචාර ලද අතර ණයගැති වටිනාකම රු.4,159,423 ක් වන ණයගැතියන් 08 දෙනෙකු පමණක් සමාගමේ ණයගැති ශේෂ සමඟ එකඟ වී තිබුණි. මේ අතර, අයකර ගැනීමකින් තොරව ණයගැති කාල සීමාව වසරක් ඉක්ම වූ වටිනාකම රු.154,569,393 ක් වන ණයගැති ශේෂයක් ද පවතී. තවද, ණයගැතියන් 28 දෙනෙකුට යවන ලද වටිනාකම රු.16,885,458 ක් වන ණයගැති තහවුරු කිරීමේ ලිපි ආපසු ලැබී තිබුණි. | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එකඟ වූ පරිදි ඒඑන්සීඑල් විසින් රු.200,000 ට වැඩි ණයගැතියන් වෙත තහවුරු කිරීමේ ලිපි යවන ලදී. කෙසේ වෙතත්, ණයගැතියන් කිහිප දෙනෙකු පමණක් ප්‍රතිචාර දැක්වූ අතර මෙම තත්ත්වය අපගේ පාලනයෙන් තොර වේ. යවන ලද තහවුරු කිරීමේ ලිපි සඳහා ප්‍රතිචාර (එකඟ වී හෝ එකඟ නොවී) නොතිබුණ ද, 2021 දෙසැම්බර් 31 වන දිනට හිඟ ශේෂයන් බොහෝමයක් 2022 මැයි 30 දින වන විට පියවා ඇත.<br><br>එකතුව රු.154,569,393 ක් වන වසරකට වැඩි කාලයක් නොගෙවූ වෙළෙඳ ණයගැතියන් යටතේ පෙන්නුම් කරන ශේෂය, බොල් ණය සඳහා ප්‍රතිපාදනයට වෙන් කර ඇත. | පවතින හිඟ ශේෂයන් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ)අදාළ සේවකයන් විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා සමාගමෙන් ඉවත්වීම හේතුවෙන්, කාලය වසර 1 සිට 20 දක්වා අයකර නොගත් එකතුව රු.7,193,905 ක් වූ ශේෂය ද සේවකයන්ගෙන් ලැබිය යුතු ශේෂය තුල දක්නට තිබුණි. | පාරිතෝෂික පනත මගින් මෙම ලැබිය යුතු මුදල් අඩු කිරීම් සඳහා ප්‍රතිපාදන සපයා නොමැති බැවින් සමාගමට මෙම මුදල් අවසාන පාරිතෝෂිකයෙන් අඩු කළ නොහැක. කෙසේ වෙතත්, සමාගම විසින් සේවය අවසන් කළ සේවකයන් හට | ණය නිකුත් කරන කාල සීමාවේ දී ණය පියවීමේ හැකියාව සමගින් ඔවුන්ගේ වයස, ප්‍රතිගෙවීම සහ ධාරිතාවය පිළිබඳ ව ඇගැයීමක් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඉතිරිය පියවන ලෙස දන්වමින් සිහි කැඳවුම් ලිපි යැවීම හා අදාළ ඇපකරුවන්ගේ නොපියවන ලද ආපදා ණය ශේෂ තුලින් පියවා ගැනීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ඇ)සමාගම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ මහජනතාවට සමාගමේ ප්‍රකාශන සඳහා ග්‍රාහක මුදල් ගෙවීමට ඉඩ දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ ග්‍රාහක ගිණුමේ දක්වන ලද හිඟ ශේෂය රු.19,961,081 ක් විය. ඉන්, රු.2,171,715 ක් වර්ෂ 1 සිට 10 ට වඩා හිඟව පවතින අතර මෙම හිඟ ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මීට පෙර ග්‍රාහකයින්ට ණය ලබා දීමට නිසි යාන්ත්‍රණයක් නොතිබුණි. සියලුම ග්‍රාහකයින් ණය පහසුකම් ලැබීමට සුදුසුකම් ලබා තිබුණි. කෙසේ වෙතත්, විකුණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු රාජ්‍ය අංශයේ ග්‍රාහකයින් පමණක් ණය සඳහා සුදුසුකම් ලැබූහ. රාජ්‍ය අංශයේ ග්‍රාහකයින්ට ණය ලබා දීමේ දී වුවද ගෙවීම් රටාව විශ්ලේෂණය කිරීමෙන් පසු මාස 03 ක් සඳහා පමණක් ණය පහසුකම් පිරිනැමේ. | මෙම ශේෂ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල | පනතේ 27 (2 ඒ) වගන්තියට අනුව 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා එකතුව රු.108,218,673 ක් වූ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රමාද ගාස්තු සඳහා වූ අධිභාරය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික හා කාර්මාන්ත කඩා වැටීමේ ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ මූල්‍ය තත්වය අයහපත් අතට හැරීම හා සමාගමේ පැවැත්ම තහවුරු කර ගැනීමට සමාගම විසින් ගෙවීම් ප්‍රමාද කර තිබුණි. කෙසේ වෙතත්, සියළුම හිග ගෙවීම් පසුව පියවා ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ 5.2.4 සහ 5.2.5 වගන්තිවලට අනුව, මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා කෙටුම්පත් අයවැය ඉදිරිපත් කළ යුතු අතර 5.2.5 වගන්තියට අනුව මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලද අවසන් යාවත්කාලීන | මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත ලැයිස්තුවට අනුව, ඒඑන්සීඑල් එකී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් නොවේ. එම නිසා, නියම කර ඇති චක්‍රලේඛ ඒඑන්සීඑල් සඳහා අදාළ නොවේ. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2021 දෙසැම්බර් 22 වන දින අයවැය අනුමත කර තිබුණ ද චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අනුමත අයවැයක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට පටහැනිව, සමාගමේ බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා කිසිදු අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකගතාවක් ලබාගෙන නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අනුමත වාර්ෂික අයවැය පිටපත් (ආදායම් සහ වියදම්, ප්‍රාග්ධන වියදම්, ප්‍රසම්පාදන සැලැස්ම සහ පුවත්පත් මුද්‍රණය, තහඩු සහ තීන්ත අයවැය) 2021 දෙසැම්බර් 09 වන දින ජනමාධ්‍ය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට හා ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කර ඇත. | |
| (ඇ)2015 ජුනි 17 දිනැති පීඊඩී/03 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 වගන්තිය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට එකතුව රු.24,423,308 ක දීමනා ගෙවා තිබුණි. | 1973 අංක 28 දරන එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) නීතිය මගින් ඒඑන්සීඑල් පාලනය වන අතර එහි විධිවිධාන අනුව, සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ව්‍යාපාරය හා සම්බන්ධ කළමනාකරණය හා පරිපාලන කටයුතු පවරා ඇත. ඒ අනුව, ඒඑන්සීඑල් සඳහා 2015 ජුනි 17 දිනැති පීඊඩී/03 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අදාළ නොවන බව අපගේ විශ්වාසයයි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ඇ)2018 සැප්තැම්බර් 18 දිනැති පීඊඩී/01 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 සහ 3 වගන්ති | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එකතුව රු.18,900,000 ක බස් රථ දෙකක් සහ වෑන් රථයක් මිලදී ගෙන තිබුණි. | 1973 අංක 28 දරන එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) නීතිය මගින් ඒඑන්සීඑල් පාලනය වන අතර එහි විධිවිධාන අනුව, සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ව්‍යාපාරය හා සම්බන්ධ කළමනාකරණය හා පරිපාලන කටයුතු පවරා ඇත. ඒ අනුව, ඒඑන්සීඑල් සඳහා | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

2015 ජුනි 17 දිනැති පීඊඩී/03 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අදාළ නොවන බව අපගේ විශ්වාසයයි. එම නිසා, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලද අධිකාරිය පැවරීම මත පදනම්ව බස් රථ දෙක මිලදී ගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.332,012,000 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.217,840,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.549,852,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් රජයෙන් ලද ප්‍රදාන හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය සමාගමේ පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශත පිලිවෙලින් 6.39 කින් හා 31.62 කින් වැඩි වී තිබුණි. පිරිවැටුම මත පරිපාලන පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව 6.73 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.31,370,320 ක් වටිනා අගරු චෙක්පත් 350 ක් තිබුණි. ඉන් රු.2,155,046 ක් වටිනා චෙක්පත් 69 ක් සහ රු.1,478,779 ක් වටිනා චෙක්පත් 10 ක් ඒවා අය කර ගැනීමට ඵලදායී පියවර ගැනීමකින් තොරව පිලිවෙලින් වර්ෂ 5 කට සහ 25 කට වැඩි කාලයක් නොපියවී පැවතුණි. | සටහන් කර ගන්නා ලදී. ණය පාලනය හා ප්‍රතිසාධන ක්‍රියාවලීන් දැඩි කිරීම තුලින් අගරු චෙක්පත් අවම කිරීම සහ නිරතුරුවම අදාළ ක්‍රියාපටිපාටි පවත්වා ගැනීම තුලින් අගරු චෙක්පත් හේතුවෙන් වන හිග ශේෂ අය කර ගැනීමේ ක්‍රියාවලියක අප නිරත වේ. | පවතිනා පද්ධතිය මනාව මෙහෙය විය යුතුය. |
| (ආ) 2008 දෙසැම්බර් මස සමාගම විසින් ලංකා පුවත් ලිමිටඩ් හි කොටස් 1200 ක් මිලදී ගැනීම සඳහා රු.1,200,000 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තව ද, 2017 වර්ෂයේ දී ලංකා පුවත් ලිමිටඩ් හි සේවකයින් තිදෙනෙකුගේ වැටුප් හා වේතන | සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ එල්කේපීබී 202.17 පදනම් කරගෙන ඒඑන්සීඑල්, ලංකා පුවත් සමාගමේ කොටස් 1200 ක ආයෝජනය කර තිබුණි. 2018 වසරේදී සේවකයන් දෙදෙනෙක් ඒ වන විටත් ඉවත් වී තිබුණු අතර එක් සේවකයෙක් ඒඑන්සීඑල් සේවක ලැයිස්තුවට එකතු වී තිබුණි. නවතම ගැසට් දැන්වීමෙන් (2020 අගෝස්තු 10) මෙම | ආදායම් උත්පාදනය කරනා ආයෝජනයන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලෙස ගෙවූ එකතුව රු.2,194,637 ක් 2021 දෙසැම්බර් 31 වන විටත් අය කර ගැනීමකින් තොරව ලැබිය යුතු ලෙස ඉතිරිව තිබුණි. | ආයතනය මාධ්‍ය අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබුණි. | |
| (ඇ)අයකර ගැනීමකින් තොරව ණයගැති කාල සීමාව වසර 2 ඉක්ම වූ එකතුව රු.24,434,086 ක් ණය අය කර ගැනීමට කළමනාකරණය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අලෙවි අංශයේ රු.24,434,086 ක් වූ අයකර ගත නොහැකි ණයගැතියන් බොල් ණය ලෙස කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ණයගැති ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ)1985 වර්ෂයේ දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නිරත වීම සඳහා ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, 2022 මැයි වන විටත් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහයන් ජනනය වී නොතිබුණි. | 1985 වර්ෂයේ සිට ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැති සමාගමකි. | අක්‍රිය ආයතන සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය. |
| (ඉ)1981 ඔක්තෝම්බර් 14 දින අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 162/5 යටතේ "මාධ්‍යවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය" පළ කර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගමට එදිරිව අපහාස නඩු 15 ක් ගොනු කර තිබූ අතර ඉන් එක් අපහාස නඩුවක් සඳහා සමාගමට එරෙහිව 2007 නොවැම්බර් 18 වැනි දින සති අන්ත පුවත්පතක් වන "සිළුමිණ" හි පළ වූ ලිපියකට අදාළව පැමිණිලිකරු සමාගමෙන් රු.මිලියන 500 ක් ඉල්ලා තිබුණි. මෙම නඩුව 2010 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී විත්තිකරුවන් සහ සමාගම වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීතිඥවරයා අදාළ උසාවි කාමරයට පැමිණ නොතිබුණි. එබැවින් පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දීමට අධිකරණය තීරණය කර තිබුණි. සමාගම විසින් මෙම තීන්දුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ සහ සිවිල් අභියාචනා මහාධිකරණයේ පෙත්සම් ගොනුකර තිබුණ ද, එම අභියාචනා දෙකම ප්‍රතික්ෂේප වී තිබුණි. | කොළඹ දිසා අධිකරණයේ එම නඩුවේ කටයුතු පරීක්ෂා කිරීමේදී, 2010 ඔක්තෝම්බර් 20 වැනි දින දිසා අධිකරණ අංක 3 හි නඩුව කැඳවා ඇති අතර විත්ති පාර්ශ්වයේ නීතිඥවරයා අංක 1 දිසා අධිකරණයේ සිටි බැවින් එය ඒක පාර්ශ්වීය නඩු විභාගයක් සඳහා නියම කර ඇත.<br><br>විත්තිකරු වෙනුවෙන් පෙනී නොසිටි බැවින්, විත්තිකරුට (ඒඑන්සීඑල්) එරෙහිව ඒක පාර්ශ්වීය නඩු විභාගයක් සඳහා නියම කර ඇත. මෙම නඩුව 2010 ඔක්තෝම්බර් 20 වැනිදා විභාගයට නියමිතව තිබිණි. 2010 සැප්තැම්බර් 30 වැනි දින පැමිණිල්ලේ ලියාපදිංචි නීතිඥවරයා විසින් මෝසමක් ගොනු කර තිබුණේ පැමිණිලිකරු විදේශගත වී ඇති බැවින් 2010 ඔක්තෝම්බර් 20 වැනි දින පෙනී සිටිය නොහැකි බවයි.<br><br>කෙසේ වෙතත්, මෙම නඩුව අංක 3 දිසා අධිකරණයේ ඉදිරිපත් වී ඇති අතර, එහිදී පැමිණිලිකරුට උසාවියේ පෙනී සිටීමට නොහැකි බවට මෝසමක් ගොනු කර ඇති බව අධිකරණය දැනුවත් නොකර, පැමිණිලිකරුගේ ලියාපදිංචි නීතිඥවරයා විසින් විත්තිකාර පාර්ශ්වයේ නීතිඥවරයා නොපැමිණීමේ අයුතු ප්‍රයෝජන ගනිමින් | සමාගමට එදිරිව ගොනු වන අපහාස නඩු අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

අනතුරුව, 2019 අගෝස්තු 30 වන දින, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ තීරණ අංක එෆ් 104.19 මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හා මෙම නඩුවට සමාගම වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකු හා ඔහුගේ සහායකයින් තෝරා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව ඔවුන්ගේ නීති ගාස්තු ලෙස සම්පූර්ණ මුදල රු.18,230,000 ක් 2019 ඔක්තෝබර් 09 දින ගෙවා තිබුණු අතර මෙම නඩුව සඳහා වැරදි උසාවි කාමරයට පෙනී සිටි නීතිඥවරයා විසින්ම නීතිඥවරුන් තෝරාගැනීම සිදු කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. තවද, මෙම නීතිඥවරයා 2020 අප්‍රේල් 08 දින විශ්‍රාම ගොස් තිබුණු අතර 2020 මැයි 15 දින කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබුණි. මේ දක්වා එම නිලධාරියාට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ඒක පාර්ශ්වීය නඩු තීන්දුවක් ලබා ගෙන ඇත.

ඒක පාර්ශ්වීය නියෝගයෙන් පසු විත්තිකරු වෙනුවෙන් සාධාරණ හේතු අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. එම පරීක්ෂණයේ දී, සමාගම් ලේකම්, සමාගමේ උපදෙස් දෙන නීතිඥවරයා මෙන්ම උපදේශකවරයා ද නඩුව සම්බන්ධයෙන් සාක්ෂි ලබා දී ඇති නමුත් උගත් අතිරේක දිසා විනිසුරුවරයා ඒක පාර්ශ්වීය නියෝගයෙන් ඉවත්වීම ප්‍රතික්ෂේප කර තිබුණි.

ඒක පාර්ශ්වීය නියෝගය අහෝසි කිරීම සඳහා සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. නමුත්, එම අභියාචනයද සිවිල් අභියාචනා මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සඳහන් කරන ලද සහනය බලාපොරොත්තුවෙන් මෙම නඩුව මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීමට නියමිතව ඇත.

මෙම නඩුව අවසානයකට ළඟාවී නොමැති බැවින් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව ඇසීම අවසන් වන තෙක් දිසා අධිකරණය ලබා දුන් ඒක පාක්ෂික නියෝගය ක්‍රියාත්මක කළ නොහැකිය. එබැවින්, ඒඑන්සීඑල් විසින් සමාගමේ නීතිඥයාට වෘත්තීමය වශයෙන් නොසැලකිලිමත්බව මත විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව නිගමනය කිරීමට මම අසමත් වෙමි.

2020 මැයි 15 සිට 2020 නොවැම්බර් 14 දක්වා කොන්ත්‍රාත් පදනම මත ඇයගේ සේවය තවත් මාස 6කට දීර්ඝ කරමින් සේවා දිගුව ලබා දීමට අධ්‍යක්ෂක මණ්ඩලයට සිදු වූයේ 2020 මාර්තු 11 වැනිදා සිට කොවිඩ් 19 ව්‍යාප්ත වීමෙන් පසු පවතින තත්ත්වය යටතේ අදාළ සියලුම ලියකියවිලි පිළිබඳව සමීප එකම නිලධාරිනිය ඇය වීම නිසාය. කෙසේ වෙතත්, එම දීර්ඝ කිරීමේ කාලය අවසන් වීමෙන් පසුව, ඇයට තවදුරටත් සේවා දිගුවක් ලබා දී නොමැත.

| | | |
|---|---|---|
| (ඊ)2018 සිට 2019 දක්වා කාලය තුළ ලබා ගත් එකතුව රු.1,086,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවීමකින් තොරව පැවතුණි. | 2018 හා 2019 කාලසීමාවන් සඳහා ඒඑන්සීඑල් ටෙන්ඩර් තැන්පතු ලෙස රු.1,086,000 ක් විවිධ සැපයුම්කරුවන්ගෙන් ලබා ගෙන තිබුණි. මෙම තැන්පතු ආපසු ගෙවීම සඳහා එම සැපයුම්කරුවන් මුල් රිසිට්පත් ඉදිරිපත් කර නොමැති බැවින් ශේෂයන් තවමත් ලෙජරය තුල පවතී. | ඉතිරිව ඇති ශේෂය නිරාකරණයට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ)සමාගමේ පුවත්පත් අලෙවි නියෝජිත ගිවිසුමට අනුව, අවම නියෝජිත තැන්පතු වටිනාකම පුවත්පත් නියෝජිතයෙකුට සති 7 ක් ඇතුළත ලැබෙන පුවත්පත් ප්‍රමාණයේ වටිනාකමට සමාන වේ. කෙසේ වෙතත්, 2021 ජුනි 30 දිනට සමස්ථ ණය රු.1,563,699 ක් ලබා ගත් ක්‍රියාකාරී නියෝජිතයින් 24 දෙනෙකුගෙන් නියෝජිත තැන්පතු ලබා ගෙන නොතිබුණි. | සඳහන් ලැයිස්තුවට ආර්.එස්.ඊ.එස් හි ප්‍රවර්ධන පුවත් ආයතන, ශාඛා කාර්යාල සහ යනාදීය ඇතුලත් වේ. මෙම ප්‍රවෘත්ති නියෝජිතායතන පත් කරනු ලබන්නේ නිල කටයුතු මත බැවින්, ඔවුන්ගෙන් තැන්පතු මුදල් ඉල්ලා නොසිටිනු ඇත. කෙසේ වෙතත්, ශාඛා කාර්යාලවල ණය පාලනය අපගේ විෂය පථයට යටත් නොවේ. ශාඛා කාර්යාලවලට අනුබද්ධ වීදි වෙළෙන්දන්ට ණය පිරිනැමීම ශාඛා කළමනාකරුවන් විසින් සෘජුවම සිදු කරනු ලැබේ. | පුවත්පත් අලෙවි නියෝජිත ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් විවිධ කාණ්ඩ වෙත ප්‍රකාශන පිටපත් නොමිලේ නිකුත් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන පුවත්පත් හතෙන් පිටපත් 1,154,607 ක් සහ වාර සඟරා 14 න් පිටපත් 87,898 ක් නොමිලේ නිකුත් කර තිබුණි. මුද්‍රිත පිටපත් අතරින් වැඩිම නොමිලේ පිටපත් ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ සියයට 22 ක ප්‍රතිශතයක් නියෝජනය කරමින් "දිනමිණ" පුවත්පතිනි. මෙම නොමිලේ පිටපත් සඳහා වැය වූ මුදල රු.84,383,996 ක් වේ. | ආයතනයේ කාර්ය මණ්ඩලයට නොමිලේ පිටපත් නිකුත් නොකිරීමේ තීරණය දැනටමත් ගෙන ඇත. | නොමිලේ ප්‍රකාශන පිටපත් ලබා ගන්නා සියළු පාර්ශව කාලීනව යාවත්කාලීන කිරීමට හා අඩු කිරීමට උත්සාහ කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගත් නැවත තක්සේරු කළ වටිනාකම රු.733,000,000 ක් වූ හෝකන්දර ප්‍රදේශයේ අක්කර 8 ක ඉඩමක් 1985 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පවතී. | සටහන් කර ගන්නා ලදී. 2013 වර්ෂයේ දී ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමෙන් හෝකන්දර ඉඩමේ අයිතිය ඒඑන්සීඑල් වෙත පවරාගෙන ඇති අතර වීආර්එස් සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා 2016 වසරේදී කොමර්ෂල් බැංකුවෙන් ණය ලබාගැනීමට උකස් කර ඇත. | සමාගම තම වත්කම් ආදායම් උත්පාදනය සඳහා උපයෝජනය කළ යුතුය. |

## 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 නොවැම්බර් 26 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව, 2020 දෙසැම්බර් 07 වන දින ස්වාධීන උපදේශකයෙකු සමාගමට බඳවා ගෙන තිබුණි. පසුව මෙම උපදේශකවරයා 2020 දෙසැම්බර් 08 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද, 2021 අගෝස්තු 17 වන දින සෞඛ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද සේවයෙන් නිදහස් කර තිබූ අතර සමාගමට කිසිදු සේවයක් ලබා නොගෙන උපදේශක වැටුප ලෙස රු.1,800,000 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. | 2020 නොවැම්බර් 26 වන දින ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යවරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව, සමීර ගමගේ මහතා උපදේශකයෙකු ලෙස සමාගමට බඳවා ගෙන තිබුණි. 2020 දෙසැම්බර් 08 වන දින එවකට ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යවරයාගේ (එකල අමාත්‍යවරයා) ඉල්ලීමකට අනුව 2020 දෙසැම්බර් 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගෙවීමේ පදනම මත ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට සමීර ගමගේ මහතා අප තනතුරෙන් සේවයෙන් නිදහස් කරන ලදී. එවකට සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි, 2021 අගෝස්තු 17 වන දින සමීර ගමගේ මහතා 2021 අගෝස්තු 16 වන දින අමාත්‍යාංශයට නිකුත් කරන ලද වැටුප් පදනම මත නැවතත් අපගේ සෞඛ්‍ය මධ්‍යස්ථානයට පැමිණියේය. | සමාගම තම කාර්ය මණ්ඩලය වැටුප් හෝ දීමනා ගෙවීමේ පදනම මත වෙනත් ආයතන වෙත සේවයෙන් නිදහස් නොකළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2022 මැයි 23 දින වන විටත්, 2017 ජූනි 6 වන දින සකස් කරන ලද සේවක සංඛ්‍යාව සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර එම සේවක සංඛ්‍යාවට අනුව පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තු සඳහා කාර්ය | 2017 ජූනි 6 දින සේවක සංඛ්‍යාව අනුව පොදු පරිපාලනය සහ කර්තෘ පරිපාලනය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 කි. ලේක්හවුස් ආයතනය සඳහා සකස් කළ උපාය මාර්ගික සැලැස්ම මත පදනම්ව සහ ස්වයංක්‍රීයකරණයෙන් සහ සැලසුම් කර ඇති හෝ ක්‍රියාත්මක වෙමින් පවතින | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 ක් විය. කෙසේ වෙතත්, පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තුවල සත්‍ය කාර්ය මණ්ඩල පිළිවෙලින් 875 ක් සහ 423 ක් වූ විය. එබැවින්, අතිරික්ත කාර්ය මණ්ඩලය 313 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවකයින් 407 ක් කොන්ත්‍රාත් පදනම මත වේ. කාර්ය මණ්ඩලයේ පිරිවැය, සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 52 ක් සහ සියයට 62 ක් විය. | පද්ධතියෙන් (ඊආර්පී, විකුණුම්, තොරතුරු තාක්ෂණ පද්ධතිය, ජාල උත්ශ්‍රේණි කිරීම්, එච්ආර්අයිඑස් පද්ධති ආදිය) මතුවන කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගනිමින් මෙම සේවක සංඛ්‍යාව සකස් කර ඇත.<br><br>කොන්ත්‍රාත් පදනම මත ආයතනයට නව පත්වීම් ලබාදීමට සිදු විය. වර්තමානයේ සමාගම තුල සේවකයින් 1,180 ක් වේ. සංශෝධිත සේවක සංඛ්‍යාවක් ඒඑන්සීඑල් තුල සිටින අතර එය අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. | |
| (ඇ)2017 වසරේදී උපදේශකවරයෙකුට රු.2,250,000 ක් ගෙවා සකස් කර ගන්නා ලද දක්ෂතා අත්පත් කර ගැනීම, උසස් කිරීම, නිවාඩු ප්‍රතිපත්තිය, කාර්ය සාධන කළමනාකරණය ආදී ප්‍රතිපත්ති හතක් සමාගම විසින් භාවිතා කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා පමණි. | උපදේශකවරයෙකුගේ උපදෙස් ඇතිව ප්‍රතිපත්ති හතක් සකස් කරන ලදී. ඒ අතරින්, කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තිය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදී. අනෙකුත් ප්‍රතිපත්ති අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. | සියළු ප්‍රතිපත්ති සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |